*සැ. යු.*– 2007.04.27 වැනි දින අංක 1,495 දරන *ගැසට් පත්‍රයෙහි* IV(අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,496— 2007 මැයි 04 වැනි සිකුරාදා — 2007.05.04**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 378 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 382 |

(i) *සැ. යු.*– ලංකා හෝටල් සංස්ථා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත 2007 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) හෙවිජ් හාරයේ භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල (පැවරීමේ) පනත් කෙටුම්පත 2007 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවත් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 මැයි මස 11 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 අප්‍රේල් මස 27 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිළධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2**. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිළධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3**. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිළධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථාද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරීවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත් වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනන්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5**. යුද්ධ සේවා අනුග්‍රහය :

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින්ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම්ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වු කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**6**. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු :

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම :

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90 (1) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකෙරෙනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවිම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් වි භාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට වි භාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවි ය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු – ඇබෑර්තු

## ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව

### ගුවන් භටයින් සඳහා පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ පහත දැක්වෙන වෘත්තීන්වල ගුවන් භටයින් සඳහා පුරප්පාඩු පවතී.

1. (අ) *වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්* :

(1) *ගුවන් යානා ඉංජිනේරු* :

(i) ගුවන් යානා යන්ත්‍ර ශිල්පී,
(ii) ගුවන් යානා සැකිලි ශිල්පී,
(iii) ගුවන් යානා විදුලි හා මේවලම් ශිල්පි

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් ඇතුළුව ගණිතය, විද්‍යාව (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම්, ගණිතය II, විද්‍යාව II) යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ඉන් ගණිතය හෝ විද්‍යාවට සම්මාන සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(2) *විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු* :

(i) ගුවන් රේඩාර් ශිල්පි ;
(ii) විදුලි පණිවුඩ යන්ත්‍ර ශිල්පි

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් ඇතුළුව ගණිතය, විද්‍යාව (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් ගණිතය II, විද්‍යාව II) යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ඉන් ගණිතය හෝ විද්‍යාවට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(iii) පරිඝණක කාර්මික ශිල්පි ;
(iv) ගුවන් විදුලි සන්නිවේදක

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයන් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කරුවෙකු විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.)

(3) *සාමාන්‍ය ඉංජිනේරු :*

(i) අවි ආයුධ ශිල්පි ,
(ii) රථ වාහන ශිල්පි ,
(iii) ගුවන් යානා ගිනියම් පැස්සුම්කරු ,
(iv) මතුපිට කාර්මික ශිල්පි,
(v) ලෝහ තහඩු කාර්මික ශිල්පි.

සිංහල/දෙමළ, සහ ඉංග්‍රීසි භාෂාවන් ඇතුළුව ගණිතය, විද්‍යාව(1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් ගණිතය II, විද්‍යාව II) යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ඉන් ගණිතය හෝ විද්‍යාවට සම්මාන සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(vi) ප්‍රවාහන ක්‍රියාකරු :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතු අතර රියදුරු බලපත්‍රයද අනිවාර්යයෙන්ම ලබා තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කරුවෙකු විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.)

(4) *සිවිල් ඉංජිනේරු* :

(i) පෙදරේරු,
(ii) පයිප්පකරු,
(iii) වඩු ශිල්පි.

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කරුවෙකු නම් විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.)

(5) *වෛද්‍ය* :

(i) හෙද සහායක,
(ii) දන්ත සහායක

සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් ගණිතය II, විද්‍යාව II) සහ වෙනත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතු ය. අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් ජීව විද්‍යා විෂයයන් තුනක් එක් වරකදී සමත්ව තිබීම උසස් වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් වේ.

(6) *සැපයීම්* :

(i) සැපයුම්කරු :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/විද්‍යාව/වාණිජ්‍ය හා ගිණුම් (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් ගණිතය II, විද්‍යාව II) යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක්ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(ii) භෝජනාගාර භාරකරු :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයන් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.)

(iii) සලාක සහකරු :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට

නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.)

(7) *පරිපාලන* :

(i) ලිපිකරු පොදු රාජකාරි:

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/විද්‍යාව/වාණිජ්‍ය හා ගිණුම් (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් ගණිතය II, විද්‍යාව II) යන විෂයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක්ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිඝණක පිළිබඳ දැනුම විශේෂ සුදුසුකමක් වේ.

(ii) ගිණුම් ලිපිකරු :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/වාණිජ්‍ය හා ගිණුම් (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් ගණිතය II) යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක්ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් විෂයයන් හය සඳහා විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා විද්‍යාව II ඊට ඇතුලත් විය යුතුයි.)

(8) *මෙහෙයුම්* :

(i) මෙහෙයුම් ගුවන් :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.)

(ii) ගිනි නිවන්නා :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයන් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.)

(iii) සුනඛ පාලක :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.)

(iv) සංගීතඥ :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය **II**, විද්‍යාව **II** යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.) සංගීතයෙන් හෝ ගායනයෙන් දක්වන කුසලතාවයන් විශේෂ සුදුසුකමක් වේ.

(v) අවිකරු :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය II, විද්‍යාව II යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.)

(9) *පොලිස්* :

(i) පොලිස් භට :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයන් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුයි. (1999/2000 වසරවල අයදුම්කරුවෙක් නම් විෂයයන් හය සඳහා ගණිතය, විද්‍යාව ඇතුලත් වන්නේ නම් ඒ සඳහා ගණිතය **II**, විද්‍යාව **II** යන විෂයයන් ඊට ඇතුලත් විය යුතුයි.)

*(ආ) අනෙකුත් සුදුසුකම්.*— ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුයි :

*නිත්‍ය ගුවන් භටයින් සඳහා* :

(1) *පුරවැසිභාවය.*– ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.

(2) *වයස.*– 2007 ජූනි මස 30 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු වූද අවුරුදු 23 ට නොවැඩි අයෙකු විය යුතුයි.

(3) *උස.*– අඩි 5 අඟල් 5 කට නොඅඩු විය යුතුයි.

(4) *බර.*– ශරීර ස්කන්ධ දර්ශකය $\frac{\text{බර (කි. ග්‍රෑම්)}}{\text{උස (මී)}^2} < 25$

(5) *පපුව.*– අඟල් 32 කට නොඅඩු විය යුතුයි.

(6) *වර්ණ දෘෂ්ටිය.*– CP2

(7) *දෘෂ්ටි තීක්ෂණතාවය.*– වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් රහිත)

(8) *සිවිල් තත්ත්වය.*– අවිවාහක විය යුතුයි. (ගුවන් හමුදාවට බැඳී වසර දෙකක් ගතවනතුරුත් මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවනතුරුත් මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහ වීමට ගුවන් භටයින්ට අවසර දෙනු ලැබේ.)

02. පළමුවන ඡේදයේ “අ” හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ පළමුවන ඡේදයේ “ආ” හි දක්වා ඇති අවශ්‍යතාවයන් හෝ සපුරා ගනු නොලබන අපේක්ෂකයන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ ඉල්ලා ඇති මිමි්වලට අනුව උස හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන්* පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ.

03. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ඨතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

04. *සේවා කොන්දේසි* :

*(අ)* ගුවන් හටයින් සේවයට බැඳුනු දා සිට ගුවන් හමුදා පනතට, ගුවන් හමුදා රෙගුලාසිවලට සහ ගුවන් හමුදා අණපනත්වලට යටත් විය යුතුයි.

*(ආ)* තෝරාගනු ලබන සියලුම වෘත්තීන්වල අදාළ ගුවන් හටයින්ට මූලික සටන් පුහුණුවත්, ඉන් පසුව වෘත්තීය පුහුණුවත් ලබා දෙන අතර, ඔවුන් ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක, දිවා රාත්‍රී ඉතා දුෂ්කර තත්ත්වයන්හි වුවද, ඕනෑම ආකාරයක රාජකාරියක් තම මව් රට තුළ දී හෝ විදේශයක දී ඉටුකළ යුතුයි.

05. *බඳවා ගැනීමේ කොන්දේසි* :

තෝරාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය ගුවන් හමුදාවේ (දෙවන/ තුන්වන පන්තියේ) ගුවන් හට ශ්‍රේණියට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 12 ක සේවා කාලයකට යටත් විය යුතුයි. ඉන් වසර 05 ක් අඛණ්ඩව සේවය කළ යුතු අතර එම කාල සීමාව නිමවීමෙන් පසු වසර 07 ක් නිත්‍ය උප සේවයට (අපේක්ෂිත කණ්ඩායමේ) කැඳවීමක් කළ අවස්ථාවකදී වාර්තා කළ යුතුයි. අවුරුදු 05 ක සේවය අවසන් වූ පසුව තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන් හටයින්ට අවස්ථාව ඇත.

06. *රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන්.*— තෝරා ගනු ලබන අපේක්ෂකයින් ශ්‍රී ලංකාණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාකල යුතුයි.

07. *වැටුප් හා දීමනා* :

*(අ)* වසරකට ගුවන් හටයින්ට අදාළ ඒකාබද්ධ වැටුප් පරිමාණ පහත සඳහන් පරිදි වේ.

*ගුවන් හට.* – රු. 1,66,560-7x1,440-10x1,800 = රු. 1,94,640

*නායක ගුවන් හට.* – රු. 1,70,880-4x1,440-11x1,800 = රු. 1,96,440

*කෝප්‍රල්* .– රු. 1,75,200-1x1,440-13x1,800 = රු. 2,00,040

*සැරයන්* .– රු. 1,78,440-10x1,800-2 x 2,520– 1 x 3,480 = රු. 2,04,960

*බලපත්‍රි සැරයන්*.– රු. 1,82,040-8 x 1,800-2 x 2,520-3 x3,480 = රු. 2,11,920.

*බලලත් නිලධාරී* – රු. 1,89,240-4 x 1,800- 2 x 2,520-9 x 3,480 = රු. 2,32,800.

ඉහත දැක්වෙන පරිදි වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමානයන්ට අනුව වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. සේවා කාලය, යහපත් කල්ක්‍රියාව සහ කාර්යක්ෂමතාව මත ඉදිරි නිලයන් පිරිනමනු ලබන අතර ඒ අනුව නියමිත වැටුප් දර්ශකයන්හි පිහිටවනු ලැබේ.

*(ආ) දීමනා* :

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 1,750 ක් ගෙවනු ලැබේ.

(2) *දුෂ්කර දීමනා* මසකට රු. 600 ක් ගෙවනු ලැබේ.

(3) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නාන් හට මසකට රු. 1,900 ක් ගෙවනු ලැබේ.

(4) විශේෂ දීමනාව මසකට රු. 2,400ක් යාපන අර්ධද්වීපයේ සේවය කරන්නන් සඳහා ගෙවනු ලැබේ. (රාජකාරී දිනකට රු. 80 බැගින්)

(5) *දිරි දීමනා.*— සේවා කාලය වසර 5 සම්පූර්ණ කිරීමෙන් පසුව මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට රු. 250 සිට රු.850 දක්වා)

(6) *ආහාර දීමනා.*— පිටත වාසය කරන ගුවන් හටයින්ට මසකට රු. 5,649.75 බැගින් ගෙවනු ලබන අතර කඳවුරු තුල වාසය කරන ගුවන් හටයින්ට නොමිලේ ආහාර සපයනු ලැබේ.

(7) *නේවාසික පහසුකම්.*— කඳවුරු තුළ වාසය කරන ගුවන් හටයින්ට නොමිලේ සපයනු ලැබේ.

(8) *ගමනාගමනය.*— වසරකට නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් (03) (ගුවන් හටයා/භාර්යාව/ළමයින්ට) ඊට අමතරව කඳවුර තුළ සිටින ගුවන් හටයින්ට මසකට එක් නිවාඩු බලපත්‍රයක් හෝ ලංගම බස් ගාස්තුව හෝ දෙනු ලැබේ.

(9) *වික්ෂේපණ දීමනා.*— මව් කඳවුරුවලින් වෙනත් ස්ථානයක රාජකාරි සඳහා යවනු ලැබූ විට මෙම දීමනාව ගෙවනු ලැබේ. (ගෙවීම් ප්‍රමාණය විවාහක/අවිවාහක බව අනුව වෙනස් වේ.)

(10) *සුදුසුකම් වැටුප්.*— ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් වූ විශේෂ පාඨමාලාවක් හදාරා ඇති හෝ විශේෂ සුදුසුකම් ඇති පුද්ගලයින්ට මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට උපරිම රු. 637.50).

(11) *යහපත් කල්ක්‍රියා ලාංඡන දීමනා.*— මෙම දීමනාව ගෙවනු ලබන්නේ තම හැසිරීම හා සාමාන්‍ය විනය ඉතා උසස් අන්දමින් පවත්වාගෙන යනු ලබන තැනැත්තන්ටය. (මසකට රු. 30 සිට රු. 204 දක්වා).

(12) *නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව.*— මසකට රු. 170 ක් ගෙවනු ලැබේ.

(13) *නැවත සේවයට බැඳීමේ වැටුප්.*— නැවත සේවයට බැඳෙන ගුවන් හටයින්ට මසකට රු. 300 බැගින් දීමනාවකට හිමිකම් ලැබේ.

(14) *වෛද්‍ය පහසුකම්.*— ගුවන් හමුදාව මගින් සෑම හටයෙකුටම නොමිලේ වෛද්‍ය පහසුකම් සපයන අතර විවාහක නම් ඔහුගේ පවුලේ අයට නොමිලේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(15) කඳවුරුවල සිට සැතපුම් 30 ක (කි. මී. 48 ක) අරයක් තුළ පදිංචි කඳවුරෙන් පිටත වාසය කරන ගුවන් හටයින් සඳහා තම වාසස්ථානයේ සිට කඳවුරු වෙත ලංගම බස් මගින් නොමිලේ ගමන් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(16) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක ගුවන් හටයින්ට මසකට රු. 1,200 සිට රු. 3,300 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමි වේ.

(17) *උපදේශක දීමනාව.*— මසකට රු. 425 සිට රු. 510 දක්වා දීමනාවක් හිමි වේ.

(18) *වෙනත් දීමනා.*— (වෙන්ව සිටීමේ හා විදේශ ගතවීම් ආදිය) ශ්‍රී ලංකා ගුවන් හමුදා වැටුප් සංග්‍රහයට අනුව මෙම දීමනා ගෙවනු ලැබේ.

(19) වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප්/ පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලු ගුවන් භටයින් දායක විය යුතුයි. අරමුදලට ගෙවිය යුතු දායක මුදල්වල අණුප්‍රමාණය 1970 වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදල් රෙගුලාසි අනුව වේ.

08. *ඉල්ලුම්කරුට උපදෙස් :*

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම්පතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2007 මැයි මස 24 වන දින දහවල් 12.00 ට පෙර ලැබෙන සේ "ආධුනිකයින් බඳවාගැනීමේ නිලධාරි", ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකල, කොටුගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි. (ලියාපදිංචි තැපැලෙන් එවනු නොලබන ඉල්ලුම්පත් බාර ගනු නොලැබේ.) අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් භටයින් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුයි. එක් අයදුම්කරුවෙක් එක් වෘත්තියකට පමණක් ඉල්ලුම්කල යුතු අතර වෘත්තීන් කීපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට හා වේලාවට පසුව කොටුගොඩ, ඒකල, ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර වෙත ලැබුණා වූ ද, මේ නිවේදනයේ අවශ්‍යතාවලට අනුකූල නොවන්නා වූ ද ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

(ආ) රජයේ සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා/ මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. තවද යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද ඒ සමග තිබිය යුතුයි.

(ඇ) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන හෝ ඉල්ලා සිටින අවස්ථාවක අපේක්ෂකයින් විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි.

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ.)

(2) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට සහතික.

(3) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පුහුණුව සහ හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.

(4) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(5) ක්‍රීඩා, ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(ඈ) නියම කරනු ලැබූ විට ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

(ඉ) කිසිදු ලියකියවිලි හෝ සහතිකවල මුල් පිටපත් ඉල්ලුම්පත් සමග නොඑවිය යුතුයි.

(ඊ) ඉල්ලුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

09. සම්මුඛ පරීක්ෂණ ශ්‍රී ලංකා ගුවන් හමුදාව කොළඹ කඳවුරේ දී පැවැත්වේ. සම්මුඛ පරීක්ෂණයන්ට සුදුසු යැයි සලකනු ලබන අපේක්ෂකයින් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුදා බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය සහ වේලාව පෞද්ගලිකව දන්වනු ලැබේ.

10. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම ඔහුගේ ජාතික හැඳුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුව ද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් සේවයට බඳවා ගනු නොලැබේ.

11. සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුසු වන අපේක්ෂකයින් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියෙහි පෙනී සිටිය යුතුයි. සම්මුඛ පරීක්ෂණ වලින් ලබාගන්නා ලකුණුවල අගය අනුව අපේක්ෂකයින් ලැයිස්තුගත කරන අතර වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂකයින් තෝරාගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහළ මට්ටමේ සිටයි.

12. අයදුම්කරුවෙකු නිර්දේශ කිරීමට කැමති ඕනෑම අයෙකු එසේ කල යුත්තේ ඔහුට චරිත සහතිකයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළඹවීමක් කිරීම, එසේ *නැතහොත්* එහිලා බලපෑමට උත්සාහ කිරීම ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වීමට හේතු වන්නේය.

13. ඉල්ලුම් පත්‍රයෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වේ.

14. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩබ්ලිව්. ඩී. ආර්. එම්. ජේ. ගුණතිලක,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

### ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් භටයින් සඳහා අයදුම්පත

01. සම්පූර්ණ නම : ——————.
(ජාතික හැඳුනුම්පතට අනුව)

02. ජාතික හැඳුනුම්පත් අංකය : ——————.

03. ඉල්ලුම් කරනු ලබන වෘත්තිය : ——————.

04. තැපැල් ලිපිනය (ලිපි එවිය යුතු ලිපිනය) : ——————.

05. ස්ථිර ලිපිනය : ——————.

06. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය : ——————.

07. දිස්ත්‍රික්කය : ——————.

08. මැතිවරණ කොට්ඨාසය : ——————.

09. ග්‍රාම නිලධාරි කොට්ඨාසය : ——————.

10. දුරකථන අංකය : ——————.

11. උපන් දිනය : ——————.
(2007 ජූනි මස 30 දිනට වයස) :
අවුරුදු : ——————, මාස :——————,
දින : ——————.

12. විවාහක/අවිවාහක බව : ——————.

13. උස : අඩි : ——, අඟල් : ——.

14. අ.පො.ස. (සා/පෙළ) විභාගය :

| අවුරුද්ද | විභාග අංකය | සමත්වූ විෂයයන් | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

15. අ.පො.ස. (උ/පෙළ) විභාගය :

| අවුරුද්ද | විභාග අංකය | සමත්වූ විෂයයන් | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

16. තනතුර සඳහා විශේෂ සුදුසුකම් (උදාහරණ වශයෙන් කාර්මික හෝ වෙනත් වෘත්තීය පුහුණුව, සහ පළපුරුද්ද ආදිය) : ————.

17. ක්‍රීඩා අතින් ලබා ඇති විශිෂ්ඨතා පිළිබඳ විස්තර : ——————.

18. පාසලේදී හෝ බාහිර සංවිධානවලදී ලබා ඇති වෙනත් විශිෂ්ඨතා : ——————.

19. මීට පෙර සන්නද්ධ සේවා හෝ පොලිස් සේවයට ඉල්ලුම් කර ඇත්නම් ඒ පිළිබඳ විස්තර : ——————.

20. සිවිල් හෝ යුද්ධ අධිකරණයේදී වැරදිකරු වී ඇති හෝ ඇඟ බැඳ හෝ තිබේ ද? එසේ නම් විස්තර සඳහන් කරන්න. : ——————.

21. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවි නාමය | ලිපිනය |
|---|---|---|
| | | |

22. ඉල්ලුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ උපරිම දැනුමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

——————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : ——————.

05-42

## පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් කොස්තාපල් තනතුර සඳහා බඳවා ගැනීම

ඉහත තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා 2007.03.16 දින පළ කර තිබූ රජයේ *ගැසට්* නිවේදන අංක 1489 ට අනුව අයදුම්පත් භාර ගැනීම 2007.04.16 දින සිට ඉදිරියට මාස 03කින් එනම්, 2007.07.16 දින දක්වා දීර්ඝ කර ඇත.

පොලිස්පති.

05-99

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ජාතික සමාජ සංවර්ධන ආයතනය
## (සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය)

### සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව සඳහා 2007/2011 අධ්‍යයන වර්ෂයට සිසුන් බඳවා ගැනීම

සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ පළමු වසරට සිසුන් බඳවාගනු ලැබේ. එය වර්ෂ හතරක (04) පූර්ණකාලීන පාඨමාලාවකි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව පැවැත්වේ.

*අධ්‍යාපන සුදුසුකම්.*– 2001/2006 යන අධ්‍යයන වර්ෂවලින් එකකදී විශ්ව විද්‍යාලයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලබා තිබීම

පහත සඳහන් කරුණු ඇතුලත්ව තමා විසින් සකස් කරන ලද අයදුම්පත්‍රය අධ්‍යක්ෂ ජනරාල් ජාතික සමාජ සංවර්ධන ආයතනය අංක 191, ධර්මපාල මාවත කොළඹ 07 යන ලිපිනයට 2007.05.08 දිනට පෙර ඉදිරිපත් කළ යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ "පළමු වසර සඳහා ඉල්ලුම් පත්‍රය" යනුවෙන් සඳහන් කරන්න.

(1) සම්පූර්ණ නම :
(2) ලිපිනය :
(3) දුරකථන අංකය :
(4) අධ්‍යාපන සුදුසුකම් (ඩිප්ලෝමාව ලද වර්ෂය සඳහන් කරන්න):
(5) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ලබා ඇති ඉහළම සුදුසුකම :

අයදුම්කරුවන් තෝරා ගැනීමේ ගාස්තු වශයෙන් අධ්‍යක්ෂ ජනරාල් ජාතික සමාජ සංවර්ධන ආයතනය නමට ලියන ලද කොළඹ 07, කුරුඳුවත්ත තැපැල් කාර්යාලයෙන් මාරු කර ගත හැකි පරිදි රු. 100 ක මුදල් ඇණවුමක් අයදුම්පත්‍රය සමග එවිය යුතුය.

වැඩි විස්තර සඳහා 011-2678838 විමසන්න.

එම්. ඒ. වර්ණකුලසූරිය,
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

ජාතික සමාජ සංවර්ධන ආයතනය
191, ධර්මපාල මාවත,
කොළඹ 07.

05-96/1

---

## ජාතික සමාජ සංවර්ධන ආයතනය

(සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය)

### සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව සඳහා 2006/2010 අධ්‍යයන වර්ෂයට සමාජ වැඩ ඩිප්ලෝමාධාරීන්ගෙන් දෙවන වසර සඳහා ඉල්ලුම්පත් කැඳවීම

සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ දෙවැනි වසරට බඳවාගනු ලබන ඩිප්ලෝමාධාරීන් වර්ෂ 3 ක් පූර්ණකාලීනව පාඨමාලාවේ නියුක්ත විය යුතුය. ඉංග්‍රීසි භාෂාවෙන් ඉගෙන ගැනීමට සුදුසු මට්ටමේ ඉංග්‍රීසි දැනුමක් තිබිය යුතුය.

පහත සඳහන් කරුණු ඇතුලත්ව තමා විසින් සකස් කරන ලද අයදුම්පත්‍රය අධ්‍යක්ෂ ජනරාල් ජාතික සමාජ සංවර්ධන ආයතනය අංක 191, ධර්මපාල මාවත, කොළඹ 07 යන ලිපිනයට 2007.05.08 දිනට පෙර ඉදිරිපත් කළ යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ "දෙවැනි වසර ඉල්ලුම්පත්‍රය" යනුවෙන් සඳහන් කරන්න.

(1) සම්පූර්ණ නම :
(2) ලිපිනය :
(3) දුරකථන අංකය :
(4) අධ්‍යාපන සුදුසුකම් (ඩිප්ලෝමාව ලද වර්ෂය සඳහන් කරන්න) :
(5) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ලබා ඇති ඉහලම සුදුසුකම :

සීමිත අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණක් තෝරා ගනු ලැබේ. මේ සඳහා වැය වන ගාස්තු වශයෙන් රු. 100.00 ක් වටිනා මුදල් ඇණවුමක් කුරුඳුවත්ත තැපැල් කාර්යාලයෙන් මාරු කර ගත හැකි වන පරිදි අධ්‍යක්ෂ ජනරාල් නමට අයදුම්පත්‍රය සමග ලැබීමට සලස්වන්න.

එම්. ඒ. වර්ණකුලසූරිය,
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

ජාතික සමාජ සංවර්ධන ආයතනය,
191, ධර්මපාල ආයතනය,
කොළඹ 07.

05-96/2

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාවලට ඇතුළත්වීම සඳහා පැවැත්වෙන තරඟ විභාගය

### 2008/2010 කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (ප්‍රවේශ විභාගය)

2008/2010 දැවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ තරඟ විභාගයක් විභාග දෙපාර්තමේන්තුව මගින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් 2007 අගෝස්තු මස 31 වන දින පහත සඳහන් මධ්‍යස්ථානවලදී පවත්වනු ලැබේ.

| *මධ්‍යස්ථාන අංකය* | *මධ්‍යස්ථානය* | *මධ්‍යස්ථාන අංකය* | *මධ්‍යස්ථානය* |
|---|---|---|---|
| (1) | අනුරාධපුරය | (7) | මහනුවර |
| (2) | බදුල්ල | (8) | කුරුණෑගල |
| (3) | මඩකලපුව | (9) | මාතර |
| (4) | කොළඹ | (10) | ත්‍රිකුණාමලය |
| (5) | ගාල්ල | (11) | වවුනියාව |
| (6) | යාපනය | (12) | රත්නපුරය |
| | | (13) | හම්බන්තොට |

කිසියම් මධ්‍යස්ථානයක් සඳහා අවශ්‍ය තරම් විභාග අපේක්ෂකයින් අයදුම් කොට නොමැතිවිට ඔවුන්ගේ දෙවැනි කැමැත්ත අනුව හෝ අයදුම් කොට ඇති මධ්‍යස්ථානයට සමීප වෙනත් මධ්‍යස්ථානයක් හෝ ඔවුන්ට නියම කෙරෙනු ඇත.

02. දැවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවට තෝරා ගැනීම

2.1 කෘෂිකර්මය පිළිබඳ මෙම පාඨමාලාව ගැහැණු පිරිමි දෙපක්ෂයටම විවෘතය. මෙම විභාගයෙන් හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ අය කුසලතාව හා දිස්ත්‍රික් පදනම මත කුණ්ඩසාලේ, කරපිංච, පැල්වෙහෙර, අඟුණකොළපැලැස්ස සහ වවුනියාව යන කෘෂිකර්ම විද්‍යාල පහට තෝරා පත් කරනු ලැබේ.

2.2 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවල පවත්වනු ලබන කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ

ලියාපදිංචි කර ඇත. මෙම පුහුණුව හුදෙක් වෘත්තීයමය වන අතර, එය පිළියෙල කරනු ලැබ ඇත්තේ පුහුණුවෙන් පසු ස්වයං රැකියාවල යෙදීමට හෝ සුදුසු රැකියාවක් ලබා ගැනීමට හෝ බලාපොරොත්තු වන කාන්තාවන්ට හා පුරුෂයන්ටය. පාඨමාලාව හදාරන කාලය තුළදී නේවාසිකව නැවතී සිටීම අනිවාර්ය වේ. ශිෂ්‍යයින්ට මෙම කාලය තුළදී වෙනත් කිසිදු ආයතනයක පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන පුහුණු පාඨමාලාවක් හැදෑරීමට හෝ රැකියාවක් ලබා ගැනීමට හෝ අවසර දෙනු නොලැබේ. කිසියම් ශිෂ්‍යයෙක්/ශිෂ්‍යාවක් කිසියම් අවස්ථාවක එවැනි පාඨමාලාවක් හදාරන බව හෝ වෙනත් කිසියම් ආයතනයක රැකියාවක නියුක්ත බව හෝ ඔප්පු වුවහොත් ඔහු/ඇය කෘෂිකර්ම විද්‍යාලයෙන් නෙරපනු ලැබේ.

2.3 සෙනසුරාදා සහ ඉරිදා දිනවල ද සමහර විට පන්ති පවත්වන බැවින් නේවාසිකාගාරවලින් බැහැරව යා හැක්කේ මසකට එක් සති අන්තයකදී පමණය. මඩ කුඹුරුවල, ගොඩ ගොවිතැන්වල ප්‍රායෝගිකව යෙදීමට මනාපයක් තිබිය යුතුය. මෙම පුහුණුවෙන් පසු රැකියා අවස්ථාවන් වැඩි වශයෙන් බලාපොරොත්තු විය හැක්කේ වියලි කලාපයේ ගම්බද පළාත් වල බැවින් එම ප්‍රදේශවල සේවය කිරීමට අයදුම්කරුවන්ට කැමැත්තක් තිබිය යුතුය.

03. *ඇතුළත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම්.–*

3.1 (අ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථ ද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය යන විෂයයන් දෙකෙන් එකකටවත් සම්මාන සාමාර්ථය ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන හතරක් (04) තිබිය යුතුය.) දෙවරටක නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 ක් අ. පො.ස. (සා. පෙ.) සමත්වීම තිබිය යුතුය. මෙහිදී එක්වරකදී විෂයයන් තුනකට සම්මාන සහිතව අවම වශයෙන් විෂයයන් 05 ක් එකවර සමත්වී තිබීම

සහ

(ආ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යා අංශයෙන් විෂය ධාරාව හදාරා උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යාව යන විෂයන් හයෙන් තුනක් එක්වර සමත්වී තිබීම

හෝ

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යා අංශයේ විෂය ධාරාව හදාරා උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යාව යන විෂයයන් හයෙන් එකක් සමත්වී තිබීම (උසස් පෙළ සඳහා ගණිතය විෂය ධාරාව හැදෑරූ සිසුන් රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව සමත් වී සිටීම මෙම පාඨමාලාවට සුදුසුකම් ලැබුවා සේ නොසැලකේ.)

(ඇ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හදාරන්නේ නම් අ.පො.ස. (සා.පෙ.) ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් තිබිය යුතුය.

3.2 2007.06.07 දිනට අපේක්ෂකයාගේ වයස අවුරුදු 17 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 25 ට වැඩි නොවිය යුතුය. රජයේ සේවයේ නියුතු අයට මෙම තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

3.3 3.1 හා 3.2 හි සඳහන් ඇතුළත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් ප්‍රවේශමෙන් කියවා බැලීමට අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති හා/හෝ නියමිත වයස් සීමාවෙන් බැහැර වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

3.4 ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් අයදුම්පත් එවීම කළ නොහැක. දැනට රජයේ දෙපාර්තමේන්තුවක හෝ ආයතනයක දැවුරුදු කෘෂිකර්ම පාඨමාලාවන් හදාරන සිසුන් මෙම පාඨමාලාව හැදෑරීමට අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

3.5 කෘෂිකර්ම විද්‍යාලයේ උගන්වන මාධ්‍ය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි බැවින් එම භාෂාවන් අතුරින් එක් භාෂාවකින් එම පාඨමාලාව හදාරා පාඨමාලාවේ විභාගයන්ට පෙනී සිටීමට අපේක්ෂකයාට හැකිවිය යුතුය. තෝරාගත් මාධ්‍යයෙන් දිගටම අධ්‍යයන කටයුතු කළ යුතුය. පාඨමාලාව අතර මගදී ඉගෙනුම ලබන මාධ්‍යය වෙනස් කළ නොහැක.

3.6 ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වනු ලබන්නේ කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ පමණි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගැනීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන්ට තරග විභාගය සඳහා තමන් කැමති මාධ්‍යයකින් පෙනී සිටිය හැක. එහෙත් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් I වන හා II වන ප්‍රශ්න පත්‍රවලට අමතරව III වන ප්‍රශ්න පත්‍රයට ද පෙනී සිටිය යුතුය. ඉංග්‍රීසි මාධ්‍යය සඳහා බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 30 කි. පාඨමාලාව සඳහා තෝරාගනු ලබන සෑම ශිෂ්‍යයෙක්ම ආරම්භයේදී තමන් විසින් තෝරා ගන්නා ලද මාධ්‍යයෙන් අධ්‍යාපන කටයුතු හා විභාග කටයුතු කළ යුතු අතර පසු අවස්ථාවකදී ඉගෙන ගන්නා මාධ්‍ය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

04. *අයදුම්පත්.–*

4.1 මෙම දැන්වීම අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාර අයදුම්කරුවන්ගේ අත් අකුරුවලින් හෝ යතුරු ලියනය කර 8" x 12" ප්‍රමාණයේ (A4 ප්‍රමාණයේ) කඩදාසියක දෙපැත්තේ තම අයදුම්පත සකස් කළ යුතුය. එහි අංක 01 සිට අංක 11 දක්වා මුල් පිටුවේ අඩංගු කළ යුතු වේ. අසම්පූර්ණව පුරවා ඇති හා ආදර්ශ ආකෘතිය අනුව සකස් නොකළ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

4.2 විභාග ගාස්තුව ලෙස විභාග කොමසාරිස් ජනරාල්ගේ 4000 -20 -03-20- 13 ආදායම් ශීර්ෂයට බැරවන සේ දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත් රුපියල් 250 ක් වටිනා මුදල් කුවිතාන්සියක් ලබාගෙන නොගැලවෙනසේ අයදුම්පත් අදාල ස්ථානයට ඇලවිය යුතුය. කුවිතාන්සියේ ඡායා පිටපතක් තමා වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගයට ගෙවන ලද ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කළ නොහැක. විභාග ගාස්තුවල කුවිතාන්සිය අයදුම්පත් සමග ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

4.3 සියලුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2007 ජූනි 07 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී ප්‍රමාද වන හෝ නැතිවන හෝ අයදුම්පත් ගැන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

4.4 අයදුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවර 2008/2010 "කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් වීම" යන්න හා පළමුවන හා දෙවන තේරීම් වශයෙන් තෝරා ඇති විභාග මධ්‍යස්ථාන වල නම් පැහැදිලිව සඳහන් කරන්න.

05. *තෝරා ගැනීමේ පිළිවෙළ.–*

5.1 ලිඛිත විභාගයේ කුසලතා ලකුණු වල එකතුව මත සහ දිස්ත්‍රික් පදනම මත තේරීම් කරනු ලැබේ. සාමාන්‍ය පෙළ විභාගයට

පළමුවන වරට පෙනී සිටි දිස්ත්‍රික්කය අයදුම් පතේ සඳහන් කිරීමේදී එම දිස්ත්‍රික්කයට අදාළ අංකය සොයා ගැනීම සඳහා මෙම *ගැසට් නිවේදනයේ* අවසානයට පළකර ඇති ඇමුණුම් අංක 01 උපයෝගී කර ගන්න. අවසාන වශයෙන් පාඨමාලාවට සිසුන් තෝරා ගැනීමට එක් එක් දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික් මට්ටමින් වැඩිම ලකුණු ලබාගත් සිසුන් සීමිත ගණනකට, සහතික පත් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ඇත. දිස්ත්‍රික් පදනම සඳහා සලකා බැලීමේ දී අයදුම්කරු අයත් දිස්ත්‍රික්කය ලෙස සලකනු ලබන්නේ, අයදුම්කරු අ.පො.ස. (සා.පෙළ) විභාගයට පළමු වරට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කයයි.

5.2 ලිඛිත විභාගය සඳහා වූ විෂයයන් හා කාල සටහන පහත සඳහන් වේ.

| | *විෂයයන්* | *කාලය* | *කාල සටහන* |
|---|---|---|---|
| (i) | ප්‍රශ්න පත්‍රය<br>කෘෂිකර්මය (ලකුණු 100 යි)<br>(අ.පො.ස. (සා. පෙළ)<br>කෘෂිකර්ම විෂය නිර්දේශය<br>අනුව සකස් කල බහුවරණ<br>හා කෙටි ප්‍රශ්න අඩංගු වේ) | පැය 1 යි | 9.30 පැය-10.30 පැය |
| (ii) | ප්‍රශ්න පත්‍රය<br>බුද්ධි පරීක්ෂණය (ලකුණු 100 යි) | පැය 1යි | 11.00 පැය-12.00 පැය |
| (iii) | ප්‍රශ්න පත්‍රය<br>ඉංග්‍රීසි භාෂාව (ලකුණු 100 යි)<br>අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි<br>විෂය නිර්දේශය අනුව සකස්<br>කෙරේ. ඉංග්‍රීසි භාෂාවෙන්<br>කරුණු අවබෝධ කර ගැනීම.<br>ඉංග්‍රීසියෙන් අදහස් සංනිවේදනය<br>කිරීමේ හැකියාවන් හා සරල<br>ව්‍යාකරණ හැකියාවන් පරීක්ෂා<br>කෙරේ. | පැය 1 යි | 13.30 පැය-14.30 පැය |

5.3 ප්‍රශ්න පත්‍ර i හා ප්‍රශ්න පත්‍ර ii සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40 ක් වත් ලබා ගත යුතු වේ. යම් මාධ්‍යයක් සඳහා මෙම අවම ලකුණු ලබාගත් විභාග අපේක්ෂකයින් නොසිටින විටකදී පමණක්, එම මාධ්‍යයෙන් කෘෂිකර්ම විද්‍යාල වලට අවශ්‍ය අයදුම්කරුවන් ප්‍රමාණය තෝරා ගැනීම සඳහා අවශ්‍ය වුවහොත් මෙම අවම සීමාවන් වෙනස් කරනු ඇත. එම ප්‍රශ්න පත්‍ර දෙකේ ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයන් දිස්ත්‍රික් පදනම මත තෝරාගෙන මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී අ.පො.ස. (උ. පෙ.) ජීව විද්‍යා විෂය ධාරාව හදාරා විෂයන් 3 කින් එකවර සමත්වූ හා තරඟ විභාගයෙන් සමත් වී වැඩි ලකුණු ලබාගෙන කුසලතාවයන් දැක්වූ අය පළමුව තෝරා ගනු ලැබේ. එවැනි අයදුම්කරුවන් නොමැති විට හෝ එවැනි අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විටදී පමණක් එම දිස්ත්‍රික්කයෙන් තෝරාගනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව සරිලන සේ අ.පො.ස. (උ. පෙළ) විෂයන් එකක් සමත් එම දිස්ත්‍රික්කයට අයත් අයදුම්කරුවන් අතරින් විභාගයෙන් සමත් වී වැඩිම කුසලතා දැක්වූ අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ. මෙම තෝරා ගැනීම අනිවාර්යෙන්ම 5.1 හි සඳහන් ආකාරයට වැඩිම ලකුණු මට්ටම අනුව හා කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර ඇති ක්‍රමයක් අනුව දිස්ත්‍රික්ක පදනම මත සිදු කෙරේ. අදාළ වර්ෂයේදී එක් එක් කෘෂිකර්ම විද්‍යාලයට ඇතුළත් කර ගනු ලබන පිරිමි හෝ ගැහැණු සිසුන් සංඛ්‍යාව එම විද්‍යාලවල පිරිමි හා ගැහැණු නේවාසිකාගාරවල ඇති ඉඩකඩ අනුව හා එම විද්‍යාලවල ඇති පුහුණු පහසුකම් අනුව තීරණය කරනු ඇත. මේ නිසා තෝරා ගැනීමේදී පිරිමි හා ගැහැණු අයදුම්කරුවන් ලබාගත් කුසලතාවන් අනුව වෙන වෙනම කාණ්ඩ දෙකක් වශයෙන් සලකා එක් දිස්ත්‍රික්කයක් සඳහා තේරීම් කරනු ලැබේ. කිසියම් දිස්ත්‍රික්කයක අවශ්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව නොමැති විටක විද්‍යාලවලට උපරිම සිසුන් ප්‍රමාණයක් ඇතුළත් කිරීම සඳහා අනෙකුත් දිස්ත්‍රික්කවලින් අවශ්‍ය සිසුන් සංඛ්‍යාවක් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයන් විසින් තම සහතික පත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ. කෘෂිකර්ම විද්‍යාලවලට තෝරා ගනු ලබන සංඛ්‍යාවට වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

5.4 සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් අනිවාර්යෙන් තමන් පාඨමාලාව හැදෑරීමට තෝරාගත් භාෂා මාධ්‍යයෙන්ම තරඟ විභාගයේදී පළමු වන හා දෙවන ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතුය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට අයදුම්කරන අයදුම්කරුවන් පමණක් තම මනාපය අනුව සිංහලෙන් හෝ දෙමළෙන් පළමුවන හෝ දෙවන ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය හැකිය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් පමණක් ඒ සඳහා සුදුසුකම් ලැබීමට ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයට පෙනී සිට, අවම වශයෙන් 50% ක් ලකුණු ලබාගත යුතු වේ. ඉංග්‍රීසි විෂයය සමත් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොසිටින අවස්ථා වලදී පමණක් මෙම අවම සීමාවන් වෙනස් කිරීමට ඉඩ ඇත. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා කුසලතාවය මත හා අනුමත කර ඇති ක්‍රමයක් අනුව දිස්ත්‍රික් පදනම මත තේරීම් සිදුකරනු ලැබේ. එහිදී ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයට, පළමුවන හා දෙවන ප්‍රශ්න පත්‍රවලට අවම සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයින් අතරින් පළමු වන ප්‍රශ්න පත්‍රය හා දෙවන ප්‍රශ්න පත්‍රයේ ලකුණු වල එකතුව අනුව වැඩිම ලකුණු ලබාගෙන ඇති අපේක්ෂකයින් පමණක් කුසලතා මත තෝරාගනු ලැබේ.

5.5 3.1 සහ 3.2 ඡේදයන්හි සඳහන් සුදුසුකම් ඇති සියලුම අයදුම්කරුවන්ට විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග මධ්‍යස්ථානයේ අදාළ නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතුය. විභාගය පැවැත්වීමට නියමිත දිනට සති දෙකකට පෙර විභාග දෙපාර්තමේන්තුව මගින් ජාතික පුවත්පත් වල පලකරනු ලබන පුවත්පත් දැන්වීමක් මගින් විභාගය පවත්වන දිනය ප්‍රසිද්ධ කරනු ලැබේ. ඒ වන විට ප්‍රවේශපත්‍රය ලැබී නොමැති යම් අයදුම්කරුවකු වේ නම් එම පුවත්පත් දැන්වීමේ සඳහන් ආකාරයට විභාග දෙපාර්තමේන්තුව අමතා තම ප්‍රවේශ පත්‍රය ලබාගැනීමට කටයුතු කිරීම සුදුසු වේ.

5.6 විභාගය පැවැත්වෙන අවස්ථාවේදී අයදුම්කරුවන් විසින් තම අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත ඔප්පු කර සිටිය යුතුයි. මේ සඳහා පහත දැක්වෙන ලියකියවිලිවලින් එකක් පිළිගත හැක.

(අ) පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

(ආ) විභාග දිනයට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බල පත්‍රයක්.

5.7 විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ප්‍රසිද්ධ ලිඛිත විභාගවලට බලපාන නීති හා කොන්දේසිවලට අයදුම්කරුවන් අවනත විය යුතුය. විභාග දෙපාර්තමේන්තුව මගින් සිසුන් ලබාගත් ලකුණු ඔවුන්ගේ ලිපිනයන්ට දන්වා එවනු ඇත. දිස්ත්‍රික් මට්ටමින් වැඩිම ලකුණු ලබාගත් සිසුන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත.

මෙම ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම හෝ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට ඉඩදීම අපේක්ෂකයාගේ සුදුසුකම් පිළිගත් බවක් නොහැඟේ. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන් පසුව හෝ යන කවර අවස්ථාවකදී වුවත් මෙම ව්‍යවස්ථාවන් අනුව නුසුදුසු යයි තීරණය වන අයදුම්කරුවන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

5.8 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අපේක්ෂකයින්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

06. "කුසුමා ලක්ෂ්මී කරුණාතිලක" සිහිවටන ශිෂ්‍යත්වය

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේදී I වන හා II වන ප්‍රශ්න පත්‍ර දෙකේ එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගත් ඕනෑම මාධ්‍යක අයදුම්කාරියකට ඉහත ශිෂ්‍යත්වයේ කොන්දේසිවලට යටත්ව වර්ෂ දෙකක් සඳහා මෙම ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබේ. ශිෂ්‍යත්වලාභියාට කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ඉගෙනුම ලැබීමට අවස්ථාව දෙනු ලැබේ. මෙම ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම රු. 10,000 වේ.

ආචාර්ය සී. කුඩාගමගේ,<br>
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2007 අප්‍රේල් මස 04 වන දී ය,<br>
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,<br>
පේරාදෙණිය.

ඇමුණුම් අංක 01

දිස්ත්‍රික්ක වල නම් හා ඒවාට අයත් අංක<br>
(5.1 ඡේදයට අදාළ වේ)

| *දිස්ත්‍රික් අංක* | *දිස්ත්‍රික්කය* | *දිස්ත්‍රික් අංක* | *දිස්ත්‍රික්ක* |
|---|---|---|---|
| 01 | අනුරාධපුරය | 14 | ගම්පහ |
| 02 | බදුල්ල | 15 | කළුතර |
| 03 | මඩකලපුව | 16 | මාතලේ |
| 04 | කොළඹ | 17 | නුවරඑළිය |
| 05 | ගාල්ල | 18 | මන්නාරම |
| 06 | යාපනය | 19 | මුලතිව් |
| 07 | මහනුවර | 20 | අම්පාර |
| 08 | කුරුණෑගල | 21 | පුත්තලම |
| 09 | මාතර | 22 | පොලොන්නරුව |
| 10 | ත්‍රිකුණාමලය | 23 | මොණරාගල |
| 11 | වව්නියාව | 24 | කෑගල්ල |
| 12 | රත්නපුරය | 25 | කිලිනොච්චිය |
| 13 | හම්බන්තොට | | |

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් කර ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය - 2008/2010<br>
(බැඳුම් තීරුව සඳහා අඟලක් ඉඩ හැරිය යුතුයි. එහි කිසිවක් නොලිය යුතු යි)

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

1. විභාගයට පෙනී සිටින මධ්‍යස්ථාන
   1. වන තේරීම .............................................
   2. වන තේරීම .............................................

එහි අංකය ................... ..................

(ගැසට් පත්‍රයේ මුල් ඡේදයට අනුව)

2. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අංකය කොටුව තුළ ලියන්න)<br>
සිංහල මාධ්‍ය - 2<br>
දෙමළ මාධ්‍ය - 3

භාෂා මාධ්‍යයට අදාළ අංකය .......................

3. පාඨමාලාව හැදෑරීමට කැමති මාධ්‍ය<br>
සිංහල මාධ්‍ය - 2<br>
දෙමළ මාධ්‍ය - 3<br>
ඉංග්‍රීසි මාධ්‍ය - 4

කැමති මාධ්‍යයට අදාළ අංකය ............

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. ස්ත්‍රී/පුරුෂ භාවය :<br>
පුරුෂ - 0<br>
ස්ත්‍රී - 1<br>
............<br>
අදාළ අංකය කොටුව තුළ ලියන්න

5. සාමාන්‍ය පෙළ විභාගයට ප්‍රථම වරට පෙනී සිටි පාසල පිහිටි දිස්ත්‍රික්කය ..................................

දිස්ත්‍රික් අංකය ..........................

5.1 ඡේදයට අනුව

6. (අ) i. මුලකුරු සමග නම :———.<br>
(පැහැදිලි අකුරින්)

ii. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරු වලින්) :———.<br>
උදා : SILVA, A. C.

(ආ) i. මුලකුරු වලින් හැඳින්වෙන නම :———.<br>
ii. මුලකුරු වලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරු වලින්) :———.

7. i. සම්පූර්ණ ලිපිනය :————.
ii. විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු සම්පූර්ණ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරු වලින්)
iii. සම්බන්ධ කරගත හැකි දුරකථන අංකය (ඇතොත්) :————.

8. අ.පො. ස. (සා.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිටි පාසල හා ලිපිනය :————.

(ආ) පළමුවරට අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය (සිංහලෙන්) :————.
(ඇ) පළමුවරට අ.පො.ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය (ඉංග්‍රීසියෙන්) :————.

9. (අ) පදිංචි මැතිවරණ කොට්ඨාසය (සිංහලෙන්) :————.
(ආ) මැතිවරණ කොට්ඨාසය (ඉංග්‍රීසියෙන්) :————.

10. උපන් දිනය :————. අවුරුද්ද : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

11. 2007.06.07 දිනට වයස : අවුරුදු : [ | ] මාස : [ | ] දින : [ | ]

12. (අ) නිවේදනයේ 3.1 ඡේදය අනුව අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයන් හය හෝ ඊට වැඩි ගණන :————.

| *විභාග අංකය* | *වර්ෂය හා මාසය* | *සමත් විෂයයන්* | *විෂය අංකය* | *සමත් ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| | | සිංහල | | |
| | | ගණිතය | | |
| | | විද්‍යාව | | |
| | | කෘෂිකර්මය | | |
| | | සමාජ අධ්‍යයනය | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

(ආ) ගැසට් නිවේදනයේ 3.1 ඡේදය අනුව සම්මාන ශ්‍රේණියේ සාමාර්ථයක් ලබා ගැනීම අනිවාර්ය කර ඇති විෂයයන් හතර පිළිබඳ විස්තර

| *විභාග අංකය* | *වර්ෂය සහ මාසය* | *සමත් විෂයයන්* | *විෂය අංකය* | *සමත් ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| 1. | | 1. සිංහල | | |
| 2. | | 2. ගණිතය | | |
| 3. | | 3. විද්‍යාව | | |
| 4. | | 4. කෘෂිකර්මය | | |
| 5. | | 5. සමාජ අධ්‍යයනය | | |

(ඇ) අ. පො. ස (උ. පෙ) විභාගය ජීව විද්‍යාව විෂය ධාරාවෙන් හදාරා ඇත් ද? ඔව්/නැත. (අදාළ නොවන වචනය කපා හරින්න.)
(ඈ) අ. පො. ස. (උ. පෙ) විභාගයෙන් සමත් විෂයයන්

| *විභාග අංකය* | *වර්ෂය සහ මාසය* | *සමත් විෂයයන්* | *විෂය අංකය* | *සමත් ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| | | 1. ජීව විද්‍යාව | | |
| | | 2. කෘෂිකර්මය | | |
| | | 3. භෞතික විද්‍යාව | | |
| | | 4. රසායන විද්‍යාව | | |
| | | 5. සත්ත්ව විද්‍යාව | | |
| | | 6. උද්භිද විද්‍යාව | | |

(ඉ) ඉහත සඳහන් සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවන්න.
(මුල් පිටපත් එවිය යුතු නොවේ.)
සහතිකවල ඡායා පිටපත් අමුණා තිබේ ද? :———.

13. i. දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :———.
ii. දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය, :———.
(ඉංග්‍රිසි කැපිටල් අකුරුවලින්)

14. මුදල් ගෙවූ කුවිතාන්සි පිළිබඳ විස්තර :———.
14.1 මුදල් කුවිතාන්සි අංකය හා දිනය :———.
14.2 මුදල් කුවිතාන්සිය ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.

මුදල් ගෙවූ කුවිතාන්සියේ උඩ කොටසේ තීරුවක පමණක් මැලියම් ගා මෙහි අලවන්න. කුවිතාන්සියක ඡායා පිටපතක් අනිවාර්යෙන්ම ඔබ ළඟ තබා ගන්න.

අයදුම්කරුගේ ප්‍රකාශය

මා විසින් මෙම අයදුම් පතෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවටත් මෙයින් සහතික කරමි. අ.පො.ස. (සා. පෙ) සමත් බවත් සිංහල, විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයක් ඇති බවත් සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය යන විෂයයන් දෙකකින් එකකට සම්මාන සාමාර්ථයක් ඇති බවත් හා උසස් පෙළ ජීව විද්‍යා විෂය ධාරාවන් හදාරා *ගැසට් නිවේදනයේ* නම් කර ඇති සුදුසුකම් ඇති බවට සහතික වෙමි. මෙහි සඳහන් කරුණු අසත්‍ය බව හෝ වැරදි බව හෝ හෙලි වුවහොත්, මා තරග විභාගයට පෙනී සිටීමට හා කෘෂිකර්ම විද්‍යාලයට තෝරා ගැනීමට නුසුදුස්සකු වන බව මම දනිමි. මෙම විභාගය සඳහා වූ සියලුම නීතිරීති පිළිපැදීමට මම එකඟ වෙමි.

........................
අයදුම්කරුගේ අත්සන

දිනය :———.

**අධ්‍යාපන සුදුසුකම් හා අත්සන සහතික කිරීම**

දෙපාර්තමේන්තුවක හෝ පාසැලක ප්‍රධානියෙක්, සාමදාන විනිශ්චයකාරවරයෙක්, නීතිඥයෙක් හෝ රුපියල් 142,500 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු විසින් මෙම අයදුම් පත්‍රය සහතික කළ යුතුයි.

ඉහතින් අත්සන් කර ඇති ................................ මයා/මිය/මෙනවිය මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට ද අත්සන යෙදූ බවත් මෙයින් සහතික කරමි. තව ද, *ගැසට් නිවේදනයේ* සඳහන් අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) සුදුසුකම් ඇති බවට *ගැසට් නිවේදනය* හා අධ්‍යාපන සහතික වල මුල් පිටපත් පරීක්ෂා කර බලා සහතික කරමි.

......................................
අත්සන සහතික කරන අයගේ,
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :———.
නම :———.
නිල නාමය :———.
ලිපිනය :———.

05-09

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

## 1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* - (වාර්ෂික)

| | | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|---|
| | | රු. | ශ. | රු. | ශ. |
| I | වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II | වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I | වන ඡේදය | 520 | 0 | 1,007 | 0 |
| II | වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III | වන ඡේදය | 468 | 0 | 907 | 0 |
| | අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | | මිළ ගාස්තුව | | තැපැල් (මෙරට) | |
|---|---|---|---|---|---|---|
| | | | රු. | ශ. | රු. | ශ. |
| (අ) | I | වන කොටස | 31 | 0 | 5 | 0 |
| | II | වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) | I | වන ඡේදය | 10 | 0 | 5 | 0 |
| | II | වන ඡේදය | 12 | 0 | 5 | 0 |
| | III | වන ඡේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01 ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැලකිය යුතුයි.*- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2007** | | | |
| මැයි | 2007.05.04 | සිකුරාදා | 2007.04.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.05.11 | සිකුරාදා | 2007.04.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.05.18 | සිකුරාදා | 2007.05.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.05.25 | සිකුරාදා | 2007.05.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2007.06.01 | සිකුරාදා | 2007.05.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.08 | සිකුරාදා | 2007.05.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.15 | සිකුරාදා | 2007.06.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.22 | සිකුරාදා | 2007.06.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.29 | සිකුරාදා | 2007.06.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2007.07.06 | සිකුරාදා | 2007.06.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.13 | සිකුරාදා | 2007.06.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.20 | සිකුරාදා | 2007.07.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.27 | සිකුරාදා | 2007.07.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.